


**ගාමිණී සපරමාදු**

එංගලන්තයේ Keith JonsonඡායාරූපාගාරයේBrand Wardඡායාරූප ශිල්පියා යටතේ වානිජ ඡායාරූපකරණය ප්‍රගුණ කළ ගාමිණී සපරමාදු ජපානයේ Zen Photographic Studioආයතනයෙන් වෙළෙඳ නිෂ්පාදන සහ ගුවන් ඡායාරූපකරණය පිළිබඳව මනා පුහුණුවක් ලැබ තිබේ. ඔහු කෙන්ට් සමූහ ව්‍යාපාරයේ සභාපතිවරයා ලෙස කටයුතු කරයි.



# වාණිජ ඡායාරූපකරණය

*" No matter how advance the camera is, it still remains an advance tool You need a forcused and commited artist make the best use of it"*

*"කැමරාව කෙතරම් දුරට දියුණු වුවත්, එය ඡයාරූප උපකරණයක් පමණි. මෙම උපකරණය හැසිරවීමට, කලාත්මක ගුණයන්ගෙන් පරිණත වූ ඡායාරූප ශිල්පියකුගේ අවශ්‍යතාව සදා නොවෙනස්ව පවතී."*

මේ නයින් බලන කල කලාත්මක ගුණයන්ගෙන් පරිණත ඡායාරූප ශිල්පියකුගේ කැමරා ඇසින් බිහිවන සාර්ථක ඡයාරූපයක්, විශ්වය භාෂාවක් ලෙස ද අපට හඳුන්වා දිය හැකිය. ඒ, මුළු ලොවටම කතා කිරීමේ හැකියාව එවැනි ඡායාරූපයක් සතු වන බැවිනි.

ඡායාරූපකරණය වාණිජ හා සමාජීය වශයෙන් ප්‍රධාන ක්ෂේත්‍ර දෙකකට බෙදේ. වාණිජ ඡායාරූපකරණය මුළුමනින්ම ප්‍රචාරක කටයුතු සඳහා යොදා ගැනෙන අතර, සමාජීය ඡායාරූපකරණය යනු විවිධ උත්සව අවස්ථා ඇතුළු විශේෂිත අවස්ථා ආවරණය කෙරෙන ක්ෂේත්‍රයයි. මේ කවර ක්ෂේත්‍රයක වුවද සාර්ථකත්වය රඳා පවතිනුයේ ඡායාරූප ශිල්පියාගේ දක්ෂතාව මත ය. ඡායාරූප ශිල්පියා වාණිජ හෝ සමාජීය හෝ කවරකු වූව ද කැමරාව පිටුපස දී ක්ෂණිකව අවසාන ඡායාරූපය මවා ගැනීමේ හැකියාව තිබිය යුතුය. එවිට ඡායාරූපය ගැනීම වඩාත් පහසු ය.


වාණිජ ඡායාරූපයක් හා සමාජීය ඡායාරූපයක් අතර විශාල වෙනසක් පවතී. විවාහ උත්සවයක් වැනි අවස්ථාවක් ඡායාරූපයට නඟන ඡායාරූප ශිල්පියකුට නිරතුරු අවධානයෙන් සිටිමින් ක්ෂණික තීරණ ගැනීමට සිදුවේ. කාර්යක්ෂමතාව ද ඔවුන් තුළ තිබිය යුතු ගුණාංගයකි. ආලෝක තත්ත්වය පිළිබඳ සිතීම ඔවුනට එතරම් ඇවැසි නොවේ. ඡායාරූපයට නඟන තැනැත්තාගේ මුහුණට ආලෝකය වැටේ නම් ඡායාරූපය ගැනීමට සුදුසු සාධක ලෙස ඔවුනට සෑහේ.

එහෙත්, වාණිජ ඡායාරූප ශිල්පියකු ඊට වැඩි යමක් සිතිය යුතුව තිබේ. විශාල කාර්ය භාරයක් ඔවුන් ගේ කරපිට පැටවේ. අව්ව වැස්ස නොතකා ඡායාරූපකරණයේ නිරත වීමට ඔවුනට සිදුවේ. ඡායාරූප ශිල්පියෙකුට විශේෂයෙන්ම පරිණත දැනුම, තමන් සිදුකරන කාර්යය පිළිබඳ අවධානය, කැපවීම හා සුවිශේෂී දැක්මක් තිබිය යුතුය. එසේම ඡායාරූපකරණය පිළිබඳ සහජ හැකියාව හෝ ප්‍රගුණ කරගත් හැකියාව ඡායාරූප ශිල්පියා සතු විය යුතුය.

අවසාන ඡායාරූපය දැකීමට පෙර, එය සිත තුළ මවාගෙන දැක්ම හඹා යාමට ඡායාරූප ශිල්පියාට හැකි විය යුතුය.

සාමාන්‍යයෙන් සමාජීය ඡායාරූප ශිල්පියෙකුට උපදෙස් දීමට කිසිවකු නොමැත. ඔහු තමාට රිසි සේ ගෝණ හසුරුවමින් ඡායාරූපකරණයේ නියැළෙයි. එහෙත්, වාණිජ ඡායාරූප ශිල්පියා සැමවිටම දැන්වීම් සමාගමේ සිටින කලා අධ්‍යක්ෂවරයාගේ උපදෙස්, ඔහුගේ ඕනෑ එපාකම් පිළිපැදිය යුතුය.

නිදසුනක් ලෙස කමිස දැන්වීමක් ගනිමු. මෙහිදී එම දැන්වීම ඉදිරිපත් කිරීමට භාරගත් දැන්වීම් සමාගම සහ සේවා දායකයා (නිෂ්පාදන සමාගම) හමු වී සාකච්ඡා කිරීම ඡායාරූප ශිල්පියාට අනිවාර්ය වේ.



මෙම සාකච්ඡාව තුළින් ඔවුනට අවශ්‍ය දේ හඳුනාගෙන එය නිවැරදිව ඡායාරූපයට හසුකර ගැනීම වාණිජ ඡායාරූප ශිල්පියකු සතු සුවිශේෂී කාර්යභාරයකි.

තෝරාගත් නිරූපන ශිල්පීන් එකී නිෂ්පාදනය ප්‍රවර්ධනය සඳහා උචිත වේද යන්න විමසිලිමත් වීම, අවශ්‍ය අදහස උද්දීපනයට අවශ්‍ය ආලෝකකරණය සැකැසීම සෞන්දර්යාත්මක ලෙස වටාපිටාව සැකසීම වාණිජ ඡායාරූප ශිල්පියකු මත පැටවෙන කාර්යභාරයන් කිහිපයකි. මෙහිදී වානිජ ඡායාරූප ශිල්පියෙකුට ඡායරූප ගැනීමට වඩා විවිධ කාර්යයන් සඳහා සුදානම් වීමේ අවශ්‍යතාව ද පැන නඟී.

වාණිජ ඡායාරූප ශිල්පියකුට ඡායාරූප ගැනීම සඳහා තවත් කීප දෙනෙකු ගේ උදව් උපකාර අවශ්‍ය විය හැකිය. එය කලා අධ්‍යක්ෂවරයෙක්, නිරූපණ ශිල්පීන්, වේෂ නිරූපණ ශිල්පීන්, කොණ්ඩ සැකසුම් ශිල්පීන් ආදී වශයෙන් ද කිසියම් දර්ශන තලයක ඡායාරූපගත කිරීම් සිදු කෙරෙන්නේ නම් දර්ශන තලය සකසන්නන් සහ සෙසු අවශ්‍ය ද්‍රව්‍ය අවශ්‍ය මට්ටමේ ද තිබිය යුතුය. නිදසුනක් ලෙස, පලතුරු කූඩයක් ඡායාරූපගත කරන්නේ නම්, පලතුරුවල තත්ත්වය පවා එකින් එක පරීක්‍ෂාවට ලක් කිරීම දක්ෂ ඡායාරූප ශිල්පියකුගේ වගකීමකි.

## උපකරණ

වාණිජ ඡායාරූපකරණයේ දී භාවිත උපකරණ අධික මිලෙන් යුක්ත ය. වාණිජ ඡායාරූප ශිල්පීන් ඉතා ඉහළ මිලක් තම නිර්මාණ වෙනුවෙන් අය කරන්නේ එබැවිනි. එම උපකරණවල නඩත්තුව ද ඉතා අනර්ඝ තත්ත්වයේ තිබිය යුතුය. ඡායාරූප ශිල්පියකු ලෙස කැමරාව පිටුපස සිට ගැනීමට පෙර එම තැනැත්තාගේ සිත සැහැල්ලු විය යුතුය. පෙර දිනයේ විවේකීව සිටීම, සැහැල්ලු ආහාරයක් ගෙන හොඳ නින්දක් ලබාගැනීම, නිදහස් සිතින් අවදි වීම හොඳ ඡායාරූපයක් බිහි වීමේ මූලික අඩිතාලම වේ.

ඡායාරූප ශිල්පියකු කැමරාව පිටුපස සිට ඡායාරූපයක් මවන අවස්ථාවේ නිස්කලංක වටාපිටාවක් තිබීම ද හොඳ නිර්මාණයක් බිහිවීමේලා අතිශය වැදගත් වේ.

ජංගම දුරකථන මෙන්ම සෙසු දුරකථන ද ක්‍රියා විරහිත කර තැබීම ඡායාරූප ශිල්පියා ගේ මානසික ඒකාග්‍රතාව සඳහා විශේෂිත වේ. ව්‍යාකූලතාවෙන් තොර සැහැල්ලු මනසින්, කලාත්මක ඇසකින්, කිසියම් විනයකින් යුක්තව කැමරාවට හසුකර ගන්නා ඡායාරූපයක් සෑම විටම පාහේ සාර්ථක ය.

ඡායාරූපයක් ගැනීම යනු කිසියම් භාවනාවකි. සෑම ඡායාරූප ශිල්පියකු ම මේ විනය ඇති කර ගත යුතුය. ඡායාරූපයක් ගැනීමට ප්‍රථම ඒ පිළිබඳ පෙර හුරුවක්, අවධානයක් ඡායාරූප ශිල්පියා විසින් ඇති කරගනු ලැබිය යුතුය. එවිට කැමරාව පිටුපස සිටගත් විට තමාට ඇවැසි ඡායාරූපය පිළිබඳ තේරුම් ගැනීමට පහසු වේ.

විශේෂයෙන් ම වාණිජ ඡායාරූප ශිල්පියකු, ඡායාරූපය ගැනීම පමණක් ප්‍රමාණවත් නොවේ. තමා ගන්නා ඡායාරූපය කිසියම් භාණ්ඩයක අලෙවි ප්‍රවර්ධනයට උපකාරී වන්නේ නම්, එම අරමුණ දක්වා ඡායාරූපය ගෙන ඒම ඡායාරූප ශිල්පියා ගේ වගකීම වේ. එසේම තමා ගන්නා ඡායාරූපයේ අඩුපාඩුකම් තම සේවාදායකයාගෙන් විමසා දැන ගැනීම ඉදිරි අවස්ථා සඳහා ගුරුහරුකමක් ද වනු ඇත. ස්වාභාවික ආලෝකය ඡායාරූපාගාරයක් තුළ මවන්නට උත්සාහ කරන අවස්ථාවලදී ඒ සඳහා යොමුව, දැක්ම සහ දැනීම අත්‍යවශ්‍ය වේ. සොබාදහමට අනුව අපට ආලෝකය ලැබෙන්නේ ඉරෙන් පමණි. ස්වාභාවික ආලෝකයේ ඡායාරූපයක් ගන්නා විට සැමවිටම සෙවණැලි තිබෙන්නේ එක් දිශාවකට ය. එමනිසා ඡායාරූපාගාරයක් තුළ ගන්නා ඡායාරූපවල ද සෙවණැලි එක් දිශාවකට තැබීමට සැමවිටම වග බලා ගත යුතුය.

## වාණිජ ඡායාරූපකරණයට පරිගණක තාක්ෂණයේ බලපෑම

පරිගණක තාක්ෂණය, ඡායාරූප ශිල්පීනට පොදුවේ සහ වාණිජ ඡායරූප ශිල්පීනට විශේෂයෙන් යහපත මෙන්ම අයහපත ද සිදු කර තිබේ.

### යහපත

* අවසාන නිෂ්පාදන වියදම අඩු කිරීමට උදව් වීම
* සුමුදු ඡායාරූප සංකලනයක් තුළින් අවසාන චිත්‍රයේ ගුණාත්මකභාවය වර්ධනය කරන්නට උදව් වීම
* නිෂ්පාදන කාලය විශාල ලෙස අඩු කිරීම මඟින් නිෂ්පාදන වියදම විශාල ලෙස අඩු කිරීම
* නවීන පරිගණක තාක්ෂණය මඟින් සරල ඡායාරූපයකට වඩාත් තීව්‍ර බවක් සහ ජවයක් ලබා දීම
* විශේෂකරණය නොමැති වී යාම තුළින් සෑම දෙනෙකුටම දැනුම, හැකියාව, අවස්ථාව වැඩි වීම.

### අයහපත

* විශාල දැනුම් සම්භාරයක් සහිතව තම වැඩ කටයුතු දින දින ප්‍රගුණ කර දැනුම වැඩි කර ගනිමින් විශාල මෙහෙවරක් සිදු කළ වාණිජ ඡායාරූප ශිල්පියා අද කැමරාවේ බොත්තම තද කරන උදාසීන ශිල්පියකු බවට පත් කිරීමට පරිගණක තාක්ෂණය හේතු වී තිබේ.

එයට හේතුව අද ඕනෑම ඡායාරූපයක් පරිගණකය මාර්ගයෙන් වෙනස් කළ හැකි වී තිබීමය. මුහුණු, ඉරියව් පවා වෙනස් කිරීමට අද පරිගණක තාක්ෂණය සමත් වී තිබේ. සාර්ධර්මවලට විරුද්ධ ක්‍රියාවන් පවා මේ හේතුවෙන් සිදු වෙමින් පවතී.

* ඡායාරූප ශිල්පය පිළිබඳ දැනුම ප්‍රගුණ කර ගැනීමට, වර්ධනය කර ගැනීමට වාණිජ ඡායාරූප ශිල්පීන් තුළ ඇති ගිජු බව පරිගණක තාක්ෂණය හේතුවෙන් අද ගිලිහී ගොස් තිබේ.

ඔවුන් නිකම්ම "ෂටර් බාස්ලා" බවට අද පත්ව තිබේ.

මෙවැනි වාතාවරණයක් යටතේ වූව ද තම වගකීම් දන්නා ඡායාරූප ශිල්පීනට තවමත් පැවතීමේ හැකියාව පවතී. පරිගණකය කවර අන්දමේ කාර්යභාරයක් ඉටු කළ ද තම හැකියාව ඒ අයුරින් ඉදිරිපත් කිරීම, සෑම ඡායාරූප ශිල්පියකු ගේ ම සදා වගකීම වේ.

## ගුවන් ඡායාරූපකරණය

බෙහෙවින් ප්‍රගුණ කර ගත යුතු අංශයකි. පොළොවේ සිට අඩි 2000 ක් පමණ ඉහළින් පියාසර කරන ගුවන් යානයක යට එල්ලී හෝ සිරුරෙන් අඩක් පිටතට සිටින සේ හෝ යානය ගොඩබස්වා ඇති විටෙක පොළොව හා රඳවන පාදම් දෙක අතර සිට හෝ ඡායාරූප ගැනීමට මෙහිදී ඡායාරූප ශිල්පියාට සිදු වේ. මෙය විශේෂයෙන් ප්‍රගුණ කර ගත යුතු ශිල්පයක් වන්නේ එබැවිනි. මෙහි දී උපකරණවල ආරක්ෂාව මෙන්ම තමන් ගේ ආරක්ෂාව ද විශේෂිත වේ.

තමන් ගේ අවශ්‍යතාව සහ ඡායාරූප ගැනීමට අවශ්‍ය දිශානතිය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ගුවන් නියමුවාට ලබා දීමේ හැකියාව ද මෙවැනි ඡායාරූප ශිල්පියකු සතු විය යුතු ය.එසේම ආලෝකය, ආලෝකයේ දිශාව, තමන්ගේ ගමන් මාර්ගය, ගමන් ගන්නා දිශාව ආදී කරුණු පිළිබඳ මනා සබැඳිතාවක් ගොඩනඟා ගැනීම ද ගුවන් ඡායාරූපකරණයේ දී අතිශය වැදගත් වේ.

## ආධුනික ශිල්පීනට

යම් කිසි තැනැත්තෙකුට ඡායාරූප ශිල්පියකු වීමට අවශ්‍ය නම්, යමක් කලාත්මකව දැකීමේ ඇසක් එම තැනැත්තාට අවශ්‍ය වේ. ඇතැමුන්ට මෙම හැකියාව සහජයෙන් උරුම වන අතර ඔවුනට ඇවැසි වන්නේ එම හැකියාව ප්‍රගුණ කර ගැනීම පමණි.සහජ හැකියාවක් නොමැති වූවන්ට ද ඡායාරූප ශිල්පය හැදෑරිය හැකි අතර ඒ සඳහා අධ්‍යයනය කර, ඕනෑකමින් සැම දෙයක් ම ඉගෙන ගත යුතු වේ. මෙහිලා සුළු දැනුමක් ප්‍රමාණවත් නොවේ. තම ප්‍රධාන අරමුණු හා අභිලාෂය විය යුත්තේ තමන් ගන්නා ඡායාරූපයේ අවශ්‍ය අරමුණ හා අභිලාෂය නිසි ලෙස ඉෂ්ට කිරීමය.

වාණිජ හෝ සමාජීය හෝ ඡායාරූප ශිල්පය යනු තවත් එක් රැකියාවක් නොවේ. එය වෘත්තියකි. සදා නොවෙනස්ව පවත්නා විනයකි. එම ක්‍රියාව කෙරෙහි ඇල්මක්, කැපවීමක් සහ විනයක් සදා නොවෙනස්ව පැවතිය යුතුය.

ඡායාරූප ශිල්පියකු සැමවිටම උත්සාහ දැරිය යුත්තේ වෘත්තීය ඡායාරූප ශිල්පියකු වීමට ය. වෘත්තිය ඡායාරූප ශිල්පියකු තුළ තිබිය යුතු ගුණාංග තමා තුළ වර්ධනය කර ගැනීමට ඔවුනට හැකි විය යුතුය. තමා තෝරාගත් මාධ්‍යය තුළ සියලු කම්කටොලු අභිබවා අපරිමිත කැපවීමකින් හා විනයකින් තම හැකියාවන් ප්‍රගුණ කර ගැනීම සෑම ආධුනිකයකු ගේ ම අදිටන විය යුතුය.

සටහන
**ලලනි මායාදුන්න**

යම් කිසි තැනැත්තෙකුට ඡායාරූප ශිල්පියකු වීමට අවශ්‍ය නම්, යමක් කලාත්මකව දැකීමේ ඇසක් එම තැනැත්තාට අවශ්‍ය වේ. ඇතැමුන්ට මෙම හැකියාව සහජයෙන් උරුම වන අතර ඔවුනට ඇවැසි වන්නේ එම හැකියාව ප්‍රගුණ කර ගැනීම පමණි.සහජ හැකියාවක් නොමැති වූවන්ට ද ඡායාරූප ශිල්පය හැදෑරිය හැකි අතර ඒ සඳහා අධ්‍යයනය කර, ඕනෑකමින් සැම දෙයක් ම ඉගෙන ගත යුතු වේ.

